# ඩිමෙන්ෂියාව

- ඩිමෙන්ෂියා යනු වයස්ගත වීමත් සමග ඇති වන සාමාන්‍ය අමතක වීමට වඩා වෙනස් මොළයේ ඇතිවන රෝගී තත්වයකි.
- විවිධ වර්ගයේ ඩිමෙන්ෂියා තත්වයන් ඇත.
- අමතක වීම සුලභම ලක්ෂණය වුවත් එහි වෙනත් රෝග ලක්ෂණ බොහෝමයක් ඇත.
- සමහර ඩිමෙන්ෂියා තත්වයන් සුවකල හැකි නිසා ඉක්මනින් ප්‍රතිකාර සඳහා යොමු වීම වැදගත්ය.
- ඩීමෙන්ෂියා රෝගය බොහෝවිට සුවකළ නොහැකි වුවත් කලින් හඳුනාගෙන ප්‍රතිකාර කිරීමෙන් රෝග ලක්ෂණ පාලනය කල හැක.

**Further Information**

www.slcpsych.lk

contactslpsych@gmail.com

**Find us on**

**Prepared by:**

Dr. Malsha Gunathilake

# ඩිමෙන්ෂියාව



## Sri Lanka College of Psychiatrists

## ඩිමෙන්ෂියාව යනු කුමක්ද?

ඩිමෙන්ෂියා යනු වයස්ගත වීමත් සමග ඇති වන සාමාන්‍ය අමතක වීමට වඩා වෙනස් **මොළයේ ඇතිවන රෝගී තත්වයකි.**

## ඔබ දන්නවාද?

ලෝක ජනගහනයෙන් වයස 65ට වැඩි සෑම 100කින් 7 දෙනෙක් පමණ ඩිමෙන්ෂියා රෝගයෙන් පෙළේ.

විවිධ වර්ගයේ ඩිමෙන්ෂියා තත්වයන් ඇත. සුලභ තත්වයන් නම්:

- ඇල්සයිමර්ස් රෝගය (Alzheimer's Disease)
- ආඝාතයට පසුව ඇතිවන ඩිමෙන්ෂියාව (Vascular dementia)
- ලුවි බොඩි රෝගය (Lewy Body Disease)

මේවා සුවකළ නොහැකි වුවත් සමහර තත්ව කලින් හඳුනාගෙන ප්‍රතිකාර කිරීමෙන් රෝග ලක්ෂණ පාලනය කල හැක.

කලාතුරකින් ඇතිවන ඩිමෙන්ෂියා තත්වයන් ප්‍රතිකාර මගින් සුවකල හැක උදා :- විටමින් ඌනතා

## ඩිමෙන්ෂියා හඳුනාගන්නේ කෙසේද?

එදිනෙදා දේවල් අමතක වීම නිසා සාමාන්‍ය පරිදි කටයුතු කරගෙන යාමට අපහසු වේ.

භාෂාමය ගැටළු- වචන අමතක වීම, කතා බහේ, ලිවීමේ හා කියවීමේ අපහසුතා ඇති වේ.

තීරණ ගැනීමේ හා ප්‍රශ්න නිරාකරණය කිරීමේ හැකියාව අඩු වේ.

ගණිතමය කටයුතු වලදී වැරදීම් නිතර සිදු වේ. උදා :- මුදල් ගණු දෙනු වලදී

දන්නා හඳුනන පුද්ගලයන්/මුහුණු හඳුනා ගැනීමට අපහසු වේ.

හුරු පුරුදු පාරවල් සොයා ගැනීමට අපහසුව අතරමං වීම.

අනසි සැක ඇති වීම (උදා : අන් අය තමන්ගේ දෑ සොරකම් කරන බවට චෝදනා කිරීම)

හැසිරීමේ වෙනස්කම් - නිතරම තරහා යාම, ලැජ්ජා බය නැති ලෙස හැසිරීම, නිකරුනේ ඇවිදීම.

## ඔබට හෝ හිතවතෙකුට ඉහත රෝග ලක්ෂණ ඇති විට කුමක් කළ යුතුද?

ළගම ඇති මනෝ වෛද්‍ය සායනයකට යොමුවන්න.

එහිදී ඔබව පරීක්ෂා කර බලා මතක පරීක්ෂණයකට යොමු කෙරේ. රුධිර පරීක්ෂණ හා අවශ්‍ය පරිදි මොළයේ ස්කෑන් පරීක්ෂණ ද සිදු කෙරේ.

මෙමගින් රෝග විනිශ්චය ලබා දේ

## ඩිමෙන්ෂියා රෝගය හඳුනා ගැනීමෙන් පසුව කුමක් සිදුවේද?

සුවකල හැකි ඩිමෙන්ෂියා තත්වයන්ට ප්‍රතිකාර සඳහා යොමු කෙරේ

ඩිමෙන්ෂියා රෝගය බොහෝවිට සුවකළ නොහැකි වුවත් කලින් හඳුනාගෙන ප්‍රතිකාර කිරීමෙන් රෝග ලක්ෂණ පාලනය කල හැක.

මේ සඳහා ප්‍රතිකාර ක්‍රම ඇත. රෝගියාට ඇති ඩිමෙන්ෂියා වර්ගය, තීව්‍රතාව හා රෝග ලක්ෂණ අනුව මෙම ප්‍රතිකාර නියම කෙරේ.

- ඖෂධ
- මොළයේ ක්‍රියාකාරීත්වය වැඩිකරන ක්‍රියාකාරකම්
- චර්යාමය වෙනස්කම්